# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබාදීමේ අත්වැලකි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි

තාක්ෂණික පත්‍රිකා අංක 29 - 2021 අප්‍රේල්


# වැඩියෙන් එරෙන කුඹුරට උචිත ශූන්‍ය බිම් සැකසීමේ තාක්ෂණය

පුරන් කුඹුරු අස්වැද්දීම පිළිබඳව වර්තමානයේ සමාජය තුළ ලොකු උනන්දුවක් තිබේ. ආහාර සුරක්ෂිතතාවයක් සොයා යන රටක වගා කළහැකි බිම්කැබලි පුරන් තත්වයේ තිබිය යුතු නැත. කෙසේ වුවත් ඉඩම් හිමියන් විසින් තමා සතු ඉඩම වගා නොකර අතහැරදමා පුරන් බවට පත්වන්නට හැරීම උදෙසා කරුණු ගණනාවක් බලපෑ හැකි බව පෙනී යයි. භූමියේ ස්වභාවය වගාවට නුසුදුසු වීම ඒ අතරින් එක හේතුවකි. විශේෂයෙන් තෙත් කලාපයේ දුර්වල ජල වහනයක් සහිතව ඇති වැඩිපුර එරෙන කුඹුරු මීට උදාහරණ සපයයි. මේවා හැඳින්වෙන්නේ හැල් නොහොත් වගල් කුඹුරු වශයෙනි. නිල්ල නැගෙන ගොයමක් තිබිය යුතු මේ බිම්කඩෙහි තම ආධිපත්‍යය ගොඩනගා ගෙන සිටින්නේ 'හම්බු' *Typha angustifoliya* වැනි පන් විශේෂයන්ය. නාගරිකයන්ගේ විසිත්ත කාමර සරසන්නට දායකවන ආකර්ශනීය සහ කල්පවතින මල් කිනිත්තක් නෙලා ගන්නට හැල් කුඹුරු අවට වෙසෙන්නන් වගුරු බිම වෙත පිය නැගුවද, ඉන් ඔබ්බට යමක් මේ පොළොවෙන් ලබන්නට ඔවුන් අසමත් වී තිබේ. ගවයින් හෝ ට්‍රැක්ටරය යොදාගෙන සී සෑම පමණක් නොව උදැල්ලෙන් පස් පෙරලීම පවා නොකළ හැක්කක්මය.





**"මෙවැනි කුඹුරු අස්වද්දන්න අපිට කල හැකි දෙයක් තමයි 'ශූන්‍ය බිම් සැකසීමේ තාක්ෂනය' යොදාගැනීම. බිම් සැකසීමේ අසීරුතාවයට විසඳුමක් ලැබෙනවා පමණක් නෙවෙයි, ඒ සඳහා දැරිය යුතු වියදම, ශ්‍රමය ආදියත් ඉතිරිවෙනවා. වල්නාශක සඳහා යන වියදම බිම් සැකසීමට යන වියදමට වඩා අඩු නිසා ආර්ථිකවත් වාසිදායකයි."**

මෙසේ පවසන්නේ බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ වල් පැලෑටි විද්‍යාව පිලිබඳ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ආර්.එම්.යු.එස්. බණ්ඩාර යි. ඔහුගේ අදහසට අනුව මුලින්ම කලයුත්තේ කලින් කන්නයේ තිබෙන ඉපනැල්ලද ඇතුළු සියලු වල්පැල මර්දනය සඳහා සියල්ල නසන වල්නාශකයක් යෙදීමය.

දැනට වෙළඳපොලේ ඇති වී වගාව සඳහා නිර්දේශිත ග්ලුෆොසිනේට් ඇමෝනියම් හෝ ටයගෆෙනසිල් මේ සඳහා සුදුසුවනු ඇත.

**"කෙසේ වුවත් සමහර ගොවීන් ඩයියුරෝන් යොදන්න පුරුදුවෙලා ඉන්නවා. එය නම් නුසුදුසුයි. එහි අවශේෂ කුඹුරේ ඉතුරුවෙලා පැල ගොයමට හානි කරන්න පුළුවන්."**



බණ්ඩාර මහතා අනතුරු අඟවයි. පැය 24 ක් ජලයේ පොඟවන ලද බිත්තරවී තවත් පැය 24 ක් යහන්කර තබා ප්‍රරෝහණය ආරම්භවීමට ඉඩහැර වැපිරීමෙන් වඩා හොඳ ආරම්භයක් ලබාගත හැකිබව හෙතෙම පවසන්නේය. මෙම වගාක්‍රමය අප මෙලෙස ඉදිරිපත් කලද ශුන්‍ය බිම් සැකසීමේ තාක්ෂණය ලෝකයට අලුත් දෙයක් නම් නොවේ. 1940 සමයේදී එඩ්වඩ් ෆෝක්නර් නමැත්තකු විසින් මෙම සංකල්පය ලොවට ඉදිරිපත් කලත්, දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු සියල්ල නසන වල්නාශක ලෝකයට හඳුන්වාදෙන තුරු තාක්ෂණයක් ලෙස එතරම් ව්‍යාප්තවූයේ නැත. එහෙත් මේ වනවිට අදාළ ක්‍රමවේදය සැලකියයුතු තරමින් ලොව පුරා පැතිරෙමින් තිබේ. 1999 දී හෙක්ටයාර් මිලියන 45 ක්ව තිබූ ගෝලීය ශුන්‍ය බිම් සැකසීමක් සහිත වගා වපසරිය 2003 වනවිට 72 ක්ද, 2009 වනවිට 111 ක් ද වී තිබීමෙන්ම මෙය මැනවින් පැහැදිලි වේ.



වගල් කුඹුරු සඳහා මෙසේ සඳහන් කලත්, අනෙකුත් කුඹුරු සඳහාත් අදාළ තාක්ෂණය භාවිතා කිරීමට පුළුවන. වර්ෂාපෝෂිත පහතරට ප්‍රදේශයන්හි වැසි ප්‍රමාදවීම හේතුවෙන් කන්නයට වගාකිරීමට නොහැකිවන අවස්ථාවලදී මේ ක්‍රමය යොදාගනිමින් මාස දෙක හමාර වැනි වයස් කාණ්ඩයේ කෙටි කාලීන වී ප්‍රභේදයක් වගාකර, සාමාන්‍ය පරිදි කලට වේලාවට කන්නය නිමාකල හැකිවේ.

**"ශූන්‍ය බිම් සැකසීමේ තාක්ෂණය එක දිගට භූමියක් සඳහා කන්න 7 ක් වුවත් භාවිතා කරන්න පුළුවන්. ඉන්පසුව නැවත සී සෑමෙන් බිම් සැකසීමකට යාමට සුදුසුයි. නමුත් එවැනි විටෙකදී යොදාගන්නා වල්නාශකය කන්නයක් පාසා මාරු කරන්න වෙනවා. එසේ නොකළහොත් එම රසායන ද්‍රව්‍යයට ප්‍රතිරෝධී වෙන වල්පැලෑටි බිහිවෙලා වල්නාශකයේ ක්‍රියාකාරීත්වය අඩපන වෙන්න පුළුවන්."**

බණ්ඩාර මහතා තවදුරටත් සඳහන් කරසිටී.


**පිටපත :** සනත් එම්. බණ්ඩාර - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව

**තාක්ෂණික කරුණු :** ආර්.එම්.යූ.එස්. බණ්ඩාර, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ

(දැනට මෙම සම්පත් දායකයා මැලේසියාවේ University Putra Malaysia හි පශ්චාද් උපාධි අධ්‍යයනයන්හි නිරතව සිටී)



පරිගණක නිර්මාණය : ගෝතමී ලියනගේ

අධීක්ෂණය හා උපදෙස් : ඩබ් .එල් හිරාන් පීරිස් (අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම් හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)